**කෑගල්ල නගර සභාව - 2020**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

කෑගල්ල නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය,වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය)181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කෑගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6(I)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම වෙළඳපලේ ගිනිගත් ගොඩනැගිල්ලේ හානිය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණු අතර රක්ෂණ සංස්ථාවෙන් ලද රු.5,000,000 ක රක්ෂණ වන්දිය, රක්ෂණ වන්දි ගිණුමකට බැර කිරීම වෙනුවට තැන්පත් ගිණුමට බැර කර තිබුණි. එසේම රක්ෂණ සංස්ථාවේ තක්සේරුගත රක්ෂණ ආවරණයෙන් තවදුරටත් ලැබිය යුතු රු.13,574,156 ක් ලැබිය යුතු රක්ෂණ වන්දි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ගිනිගත් ගොඩනැගිල්ලේ හානිය හා අලුත්වැඩියා කිරීම 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස නිළධාරීන් දැනුවත් කළ බවත් ඉදිරියේදී රක්ෂණ හා වන්දි ගිණුමක් ආරම්භ කිරීමට අදාල නිළධාරීන්ට උපදෙස් ලබා දුන් බවත් දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |
| (ආ) | වර්ෂයේ අවසාන මාස 04 සඳහා මුද්දර ගාස්තු උපලේඛන ලබානොගෙන 2019 වර්ෂයේ එම මාසවලට අදාළ රු.4,899,951 ක වටිනාකම සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා 2019 වර්ෂයේ දී ලද රු.991,384 ක වරිපනම් වෙනුවෙන් දුන් වට්ටම් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | වරිපනම් බදු සඳහා අදාල වට්ටම් ලබාදීම බලාත්මක වන්නේ වාර්ෂිකව පනවනු ලබන ගැසට් නිවේදනය අනුව බව දන්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා ඉකුත් වර්ෂයේ ලද වරිපනම් වෙනුවෙන් දුන් වට්ටම් ගණනය කර ගිණුම්ගත කල යුතුයි. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.150,000 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී ජර්නල් සටහන් මගින් එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. 6,526,737 ක් හා උප ලේඛන අනුව වටිනාකම රු. 6,471,988 ක් වූයෙන් රු. 54,749 ක වෙනසක් විය. | අත්තිකාරම් වෙනස ලේඛනයේ සටහන් කිරීමේදී සිදුවූ වෙනසක් බවත් පුස්තකාල පොත් ශේෂය දීර්ඝ කාලයක සිට ගිණුම් තැබීමේදී සිදුවී ඇති දෝෂයක් නිසා සිදුවූ වෙනසක් වන හෙයින් ඉදිරියේදී සභාවට යොමුකර කපා හැරීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.71,627,845 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු. 81,870,582ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් හා බදු | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,544,790 ක් විය. එමෙන්ම චක්‍රලේඛය ප්‍රකාරව වරිපනම් තක්සේරු කිරීමකින් තොරව1999 වර්ෂයේදී සිදුකර තිබූ වරිපනම් තක්සේරුව මත පදනම්ව සමාලෝචිත වර්ෂය දක්වා වරිපනම් බදු අයකර තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් දේපල තහනමට ගැනීමේ කටයුතු සිදු නොකළ බවත්, වර්ෂයකට වැඩි කාලයක් හිඟහිට ඇති වරිපනම් බදු වලින් වැඩි කොටසක් හිමිකම් නොකියන දේපල බැවින් වරිපනම් බදු අයකර ගැනීමට නොහැකි නිසා දේපල තහනමට ගැනීමේ කටයුතු ද සිදුකල නොහැකි බවත් වරිපනම් තක්සේරු කටයුතු මෙතෙක් ඉටුවී නොමැති බවත් දන්වා තිබුණි. | නගර සහා ආඥා පනත ප්‍රකාරව කටයුතුකර හිඟ ශේෂ අයකර ගත යුතු අතර වරිපනම් තක්සේරු කටයුතු චක්‍රලේඛය ප්‍රකාරව කළ යුතුයි. |

(ආ) කුලී

----

| | |
|---|---|
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟ හිට ඇති එකතුව රු. 1,276,392 ක් වූ කුලී හා ගාස්තු සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බවත්, අයකර ගත නොහැකි ගාස්තු පොත්වලින් කපා හැරීමේ නියෝග ලබා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර හා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, දන්වා තිබුණි. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

(ඇ) වෙනත් ආදායම්

------------------

| | | | |
|---|---|---|---|
| (i) | අයවිය යුතු දැන්වීම් පුවරු ගාස්තු හිඟ ශේෂය රු.324,240 ක් විය. | හිඟ මුදල අයකර ගැනීම සඳහා කටයුතු කරන බව දන්වා තිබුණි. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ii) | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟහිට ඇති දඩ ආදායම රු. 2,096,580 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකරගත නොහැකි දඩ පොත්වලින් කපා හැරීමේ නියෝග ලබා ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර හා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් අනෙකුත් මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බවත් දන්වා තිබුණි. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර වටිනාකම රු.14,985,275 ක් විය. | ලැබිය යුතු ශේෂ ගෙන්වා ගැනීමට කටයුතුකරන බව දන්වා තිබුණි. | ලැබිය යුතු ශේෂ ගෙන්වා ගත යුතුයි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 3න් ගණකාධිකාරී හා පරිපාලන සේවා නිලධාරි තනතුරු දෙකම පුරප්පාඩුව පවතින අතර නගර සභාවකට අත්‍යාවශ්‍ය සේවාවක් වන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරද පුරප්පාඩුව පවතී. මෙම පුරප්පාඩු සම්බන්ධව මාසිකව අදාල බලධාරීන් වෙත වාර්තා කර තිබුණද එම පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. | තනතුරු ඌනතා සම්බන්ධව විස්තර මාසිකව ඉහල කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරනු ලැබුවද මෙතෙක් ඒ සඳහා සුදුසු විසඳුම් ලැබී නොමැති බවත් සියලුම ස්ථිර පත්කිරීම් සිදුකළ යුත්තේ සබරගමුව පළාත් සභාව විසින් බවත් දන්වා තිබුණි . | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුයි. |